අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

**50 | S | I, II**

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியவும் I, II
**Drama & Theatre I, II**

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**නාට්‍ය හා රංග කලාව (සිංහල) II**

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**

01) විකෘති නාට්‍යය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම නාට්‍යයේ ප්‍රධාන චරිතය නම් කර එම චරිතය මුහුණ දෙන බේදවාචකය සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) මෙම නාට්‍යයේ සමාජය පිළිබඳව මනා අවබෝධයකින් කටයුතු කරන චරිතය නම් කරන්න. (ලකුණු 02)

(iii) මෙම නාට්‍යයේ පසුතල අලංකරණයේ විශේෂ අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv) විකෘති නාට්‍යයේ ජවනිකාවන්හි දැක්වෙන ස්ථාන දෙකක් දක්වන්න. (ලකුණු 02)

(v) මෙම නාට්‍යයේ දක්නට ලැබෙන බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ රංග රීතියේ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(vi) මෙහි රංග වස්ත්‍ර නිර්මාණය කළ ශිල්පියා සඳහන් කරන්න. (ලකුණු 02)

02) (i) ප්‍රේක්ෂකයා යනු කවරෙක් ද? (ලකුණු 02)

(ii) ප්‍රේක්ෂකයෙක් සතු විවිධ භූමිකා දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රේක්ෂකයා නාට්‍යයට අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

03) (i) නාට්‍යධර්මී නාට්‍යයක භාවිත වන අංගරචනා ප්‍රභේදය කුමක් ද? (ලකුණු 02)

(ii) අංගරචනා ශිල්පියෙකු විසින් වඩාත් අවධානය යොමු කළ යුතු මුහුණේ කලාප නම් කරන්න. (ලකුණු 04)

(iii) ඔබ අංගරචනා ශිල්පියෙකු යැයි සිතා නාට්‍යයක අංගරචනය සිදුකරන අවස්ථාවක දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ පැහැදිලි කරන්න. (ලකුණු 06)

04) (i) බන්ධුල ජයවර්ධන විසින් ග්‍රීක නාට්‍යයක් ඇසුරෙන් නිර්මාණය කළ අනුවර්තන නාට්‍යය නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔහුගේ ස්වතන්ත්‍ර නාට්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) මෙතුමාගෙන් මෙරට නාට්‍ය කලාවට සිදු වූ සේවාව පැහැදිලි කරන්න. (ලකුණු 06)

05) (i) සමාරෝපය යනු කුමක් දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) සමාරෝපයේ ප්‍රභේද කීයද? ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) රූපණ ශිල්පියෙකු රූපණයේ දී සමාරෝපය භාවිත කරන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06)

06) (i) අධ්‍යක්ෂවරයා යනු කවරෙක් දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) අධ්‍යක්ෂවරයා නළුවරණයේ දී භාවිත කරන ක්‍රම හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) අධ්‍යක්ෂණ ක්‍රියාවලියේ දී ඔහු අනුගමනය කරන ක්‍රියාවලිය පිළිවෙළින් විස්තර කරන්න. (ලකුණු 06)

07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කර ගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකිය.

සුපුරුදු පරිදි නිවස බලා යාමට බස් රථයට ගොඩ වන හිමාලිට දක්නට ලැබෙන්නේ වෙන දා මෙන් තදබදයෙන් පිරුණු බස් රථය නොව, හිස් ආසන පෙළ පමණි ...

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා (ලකුණු 04)

(iii) කුතුහලය සහ චරිතයක නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04)

*****